කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
**Ministry of Agriculture**

පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය
உர உற்பத்தி மற்றும் வழங்கல்கள், இரசாயன உரங்கள் மற்றும் கிருமிநாசினி பாவனை ஒழுங்குறுத்துகை இராஜாங்க அமைச்சு
**State Ministry of Production and Supply of Fertilizer and Regulation of Chemical Fertilizer and Insecticide Use**

නො. 80/5,ගොවිජන මන්දිරය, රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල
இல.80/5,கொவி ஜன மந்திரய, ரஜமல்வத்த ஒழுங்கை, பத்தரமுல்லை
No. 80/5,GovijanaMandiraya, Rajamalwatta Avenue, Battaramulla

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | 7/1/1/2020Sep/Stock | ඔබේ අංකය. / உமது இல. / Your No. | | දිනය. / திகதி. / Date. | 2020.09.10 |

සභාපති
සී/ස ලංකා පොහොර සමාගම

සභාපති
සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම

ප්‍රධාන විධායක නිලධාරීන්
සහනාධාර පොහොර ආනයනික පෞද්ගලික පොහොර සමාගම්

## වී හැර අනෙකුත් බෝග සඳහා පොහොර සහනාධාර ප්‍රතිපත්තිය සංශෝධනය කිරීම

2020/21 මහ කන්නයේදී හිඟයකින් තොරව පොහොර සැපයීම සඳහා වන කඩිනම් වැඩසටහන යන මැයෙන් ඉදිරිපත් කළ අංක 20/1306/304/016 දරන 2020.09.03 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020.09.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව 2020.09.09 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි වී හැර අනෙකුත් බෝග සඳහා භාවිතා කරනු ලබන රසායනික පොහොර 50kgක මිටියක මිල රු.1500/-ක සහනාධාර මිලකට මිලදී ගැනීමට හැකිවන පරිදි විවෘත වෙළඳපල උපරිම සිල්ලර මිලක් නියම කිරීමට තීරණය කර ඇත. ඒ අනුව පහත දැක්වෙන පියවරයන් අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය.

1. වී හැර අනෙකුත් බෝග වගා කරන ගොවීන්ට අවශ්‍ය කරන පොහොර වර්ග වන යූරියා, ත්‍රිත්ව සුපර් පොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ්, ඇමෝනියම් සල්ෆේට්, පොටෑසියම් සල්ෆේට්, කොමර්ෂල් එප්සම් සෝල්ට්, ඩයි ඇමෝනියම් පොස්පේට්, කැල්සියම් ඇමෝනියම් නයිට්‍රේට්, සින්ක් සල්ෆේට්, කීසරයිට් යන රසායනික පොහොරවල සෘජු හෝ මිශ්‍ර 50kgක මිටියක් රු.1500/-ක උපරිම සිල්ලර මිලක් යටතේ හිඟයකින් තොරව විවෘත වෙළඳපොලෙන් මිලදී ගැනීමට හැකිවන පරිදි අලෙවි කිරීමට 2020.09.09 වන දින සිට වහාම පියවර ගත යුතුය.

2. 2020.09.05 සහ 06 දිනවල ජාතික පොහොර ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු කරන ලද තොග සත්‍යාපනයට අමතරව දැනටමත් ඔබ වෙත ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂවරයා විසින් ලබා දී ඇති උපදෙස් අනුව 2020.09.08 දිනට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ලියාපදිංචි විගණක සමාගම් මඟින් සිදු කරන ලද තොග සත්‍යාපන වාර්තා කඩිනමින් ජාතික පොහොර ලේකම් කාර්යාලය වෙත විධිමත්ව භාරදීමට කටයුතු කළ යුතුය.

3. එහිදී විගණකාධිපතිගේ අංක SIN/C/AG/SAC/2020/03 දරන 2020.09.08 දිනැති ලිපියෙන් ලබා දී ඇති උපදෙස් පරිදි පොහොර තොග සත්‍යාපනයේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

   I. පොහොර තොග සත්‍යාපනයේදී නියැදි පදනම භාවිතා නොකොට සම්පූර්ණ තොගයම ආවරණය වන පරිදි සත්‍යාපනයක් සිදු කළ යුතුය.

   II. තොග සත්‍යාපනය සඳහා යොදවා ගනු ලබන ප්‍රසිද්ධ වෘත්තීය ගණකාධිකාරී සමාගම් මඟින් ගණනය කරන ලද තොගය සඳහා කොන්දේසි විරහිත සහතිකවීමක් ලබාගත යුතුව ඇත.

රාජ්‍ය ලේකම් / இராஜாங்க செயலாளர் / State Secretary — දුරකථන தொலைபேசி Telephone - / ඊ-මේල් மின்னஞ்சல் e- mail - / ෆැක්ස් தொலைநகல் Fax -
කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන தொலைபேசி Telephone - / ඊ-මේල් மின்னஞ்சல் - / ෆැක්ස් தொலைநகல் Fax -